# සැඟවුණු නිධානය

H.D. විහගි නෙතාසා ආරියරත්න

# සැඟවුණු නිධානය


H.D. විහගි නෙතාසා ආරියරත්න

කර්තෘ



පළමු දිගහැරුම



පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

ශ්‍රේණිය : 6 – D



කෘතිය පළ කරන දිනය : 2026.06.10

ISBN : 978-624211393-7

# පිදුම

මා මෙලොවට බිහිකර

සෙනෙහසින් හදා වඩා ගත්

ආදරණීය දෙමාපියන්ට,

කුඩා කල සිට සිප්සතර දායාද කළා වූ

ගුරු මාපියන්ට සේම

කලා කටයුතු කෙරෙහි වදනින් හෝ සහාය දැක්වූ

කෙනෙකු වී නම්

ඒ සැම ද සිහිපත් කරමි.

- කර්තෘ -



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# පටුන


1. හිරලි සහ වයලට්ගේ විනෝදාංශය 1- 2

2. වන තරණය 3 - 4

3. අතරමං වීම 5 - 6

4. වනයේ ගත කළ පළමු රාත්‍රිය 7 - 9

5. අපූරු සිදුවීමක් 10 - 12

6. නිධානය සොයා යාම 13 - 14

7. නිධානය ගොඩ ගැනීම 15 - 18

## 1. හිලරි සහ වයලට්ගේ විනෝදාංශය

සැන්ඩ් පැන්සිස්කෝ නුවර පිහිටි ෆේවර්ලි පුඩන්ස් පාසල මාස දෙකක් දිගු ග්‍රීෂ්ම නිවාඩුව පුරා දැඩි නිහඬ බවක ගිලී තිබුණා. එම පාසලේ ඉගෙනුම ලැබූ හිරලි සහ වයලට් යන ශිෂ්‍යාවන් දෙදෙනා මෙම දිගු නිවාඩු කාලය ප්‍රයෝජනයට ගෙන විනෝද චාරිකා රැසක්ම යොදා ගත්තා. ඔවුන් සෑම නිවාඩු කාලයක ම පාලු නිවෙස් පරීක්ෂා කිරීමට යොදා ගත්තා. එය පුංචි ගැහැණු දරුවන් දෙදෙනාට මහත් විනෝදයක් වුණා.

ඔවුන්ගේ විනෝදාංශය ද පාළු නිවෙස් පරීක්ෂා කිරීමයි.

ඔවුන් මෙලෙස ස්ථාන කීපයක් ම පරීක්ෂා කර තිබූ නමුත් එක් ස්ථානයක්වත් බිය ජනක බවක් නොපෙන්වීය.

ඔවුන්, ගිය මාසයේ පාසල් නිවාඩු ගතකිරීමට පළමුව ගොස් තිබෙන්නේ ක්ලාරින් බංගලාවටයි. එහෙත් එහි කිසිදු අද්භූත බවක් තිබී නැත. එහි ඇතුළත කෞතුකාගාරයක් මෙන් අතීතයේ පරිහරණය කරන ලද ඉතා පැරණි ගෘහ භාණ්ඩ ආරක්ෂාකාරී ලෙස තබා ඇත.

දෙවෙනි ස්ථානය ලෙස ඔවුන් තෝරා ගෙන තිබෙන්නේ ලාමක් බංගලාවයි. එහි ඇතුළත මමියක් තිබෙන බවට කටකතාවක් පැතිර ඇත. එනිසා ඔවුන් එය තෝරා ගෙන

ඇත. එහෙත් එම බංගලාව තුළ මමියක් හෝ වෙනත් කිසිවක් තිබී නැත.

ඔවුන් තෝරා ගත් තුන්වන ස්ථානය වන්නේ 'හැරිල් පෝල්' නමින් ප්‍රසිද්ධ හිර කොටුවකි. එම හිර කොටුවේ සිරවී සිටි අයගේ අවතාර එහි සැරිසරන බව දැන ගැනීමෙන් කුඩා දැරියන් එය තෝරාගෙන ඇත.

එහෙත් ඔවුන් දුටුවේ බිත්තිවල ඇඳ ඇති බිහිසුණු චිත්‍ර පමණි. ඒ හිර කොටුව නැරඹීමට ගිය මිනිසුන් චිත්‍රවලට බිය වී හිර කොටුවෙන් එළියට පැමිණ ඇත.

එම මාසේ නිවාඩුව සති දෙකක් වූ නිසා හිලරිට සහ වයලට්ට වෙනත් ස්ථාන පරීක්ෂා කිරීමට නොහැකි වුණා.

## 2. වන තරණය

හිලරි ඇගේ නිවස අසල ඇති වනරොද පිරික්සීමට වයලට්ට ද පැමිණෙන ලෙස කිව්වා. වයලට් උදෑසන ම පැමිණි නිසා ඔවුන්ට අවශ්‍ය බඩු ලෑස්ති කර ගැනීමට පහසු වුණා.

හිරලි වයලට් ද කැටුව වනය තුළට ඇතුල් වුණා. වනයේ ඇති සුන්දරත්වය නරඹමින් ඔහුන් දෙදෙනා වනය මැදට ම පැමිණ ඇති බව දුටුවේ උදෑසන දහයත් පසු වූ විටය. වයලට්ගේ අතෙහි වූ ඔරලෝසුව ඔවුන්ට මහත් ප්‍රයෝජනයක් වුණා.

ඔවුන් ගසක් යට වාඩි වී හිලරි ගෙනැවිත් තිබූ බිස්කට් පැකට්ටුව කා, හැකි පමණ වතුර බී ගමන ආරම්භ කළා.

මෙලෙස ඔවුන් පැය දෙකක් පමණ ගමන් කළා. හිලරි වනයේ ඇති විවිධ ගෙඩි වර්ග කෑමට පටන් ගත්තා.

"මොකද හිලරි කැලෑ ගෙඩි කන්නෙ"
"මට බඩගිනියි වයලට්, උදේ කලබලේට බත් දෙක දාගන්නත් බැරි වුණා."

"ඔයාට බැරි වුණාට මම දාගත්තනේ" එහෙනම් අපි දැන් කමු" හිලරි සතුටින් කෑ ගැහුවා. වයලට් මහා හඬින් හිනා වුණා. ඔයාගේ බත් එකත් මං ළඟනේ, ඕන නම් ඇවිත්

ගන්න.” කියූ වයලට් වේගයෙන් දුවන්න ගත්තා. හිලරිත් ඒ පසු පසුපසින් දුවන්නට පටන් ගත්තා.

මෙසේ දිවූ දෙදෙනා ගමං ඉවුරක් අසල නැවතුණා. ඒ ගඟේ වතුර සිඳී තිබූ නිසා ඔවුන් දෙදෙනා ගඟෙන් එගොඩ වුණා. විශාල ගල්තලාවක් මත වාඩි වූ වයලට් හිලරිගේ බත් මුල පසෙකින් තබා තමන්ගේ බත් මුල කෑමට පටන් ගත්තා. එය දුටු හිලරි ගඟේ ඉතිරි වූ පිරිසුදු ජලයෙන් අත සෝදාගෙන බත්මුල කා වතුර බීවා. තවමත් කන වයලට් දුටු හිලරිට එක්වනම හිනා පහළ වුණේ හදිසියේ යමක් මතක් වූ නිසා. මීට බොහෝ ඉස්සර දවසක් බත් ගුලියක් හිරවී වයලට් බිය වූ නිසා ඇය දැන් බොහෝ වේලා සපමින් සිටියි. හිලරි සිනාවෙන කාරණය හඳුනාගත් වයිලට් කෝපයෙන් හිලරි දෙස බැලුවා.

## 3. අතරමං වීම

එවිට ම බත්මුල බෑගයට ඔබා ගත් වයලට් ගෙහෙන් අත සෝදා ගන්න වනය තුළට යාම ආරම්භ කළා. හිලරි වයලට් පසු පසින් යන්න ගත්තා. වයලට්ගේ කෝපය නිවෙන තුරු ඇය සමඟ කතා නොකිරීමට හිලරි සිතා ගත්තා. මෙසේ යද්දී වයලට් නොසිතූ ලෙස වළකට ඇද වැටුණා.

"ටිකක් ඉන්න මං ඔයාව උඩට ගන්නම්" කිවූ හිලරි තම බෑගයේ තිබූ කඹය ගෙන එක් කෙළවරක් වලට දමා අනෙක් කෙළවර අසල තිබූ ගසක බැන්දා.

කඹයේ එල්ලී උඩට ආ වයලට්, හිලරිට ස්තූති කළා.

හදිස්සියේ යමක් මතක් වී කලබල වූ හිලරි වයලට් දෙසට හැරුණා.
"ඇයි මොකද උනේ හිලරි?"
"මගේ තාත්තා මේ කැලේ මැද සොයා ගැනීමට වළක් කැපුවා මට මතකයි" හිලරි කිව්වා.

"එහෙනමං අපි ඉන්නේ කැලේ මැද" වයලට් කිව්වා.
"වේලාව කීයද වයලට්" හිලරි ඇසුවා. "හතරයි" වයලට් කිව්වා. "දැන් අපිට ගෙදර යන්න පාර සොයාගන්න බැරි වෙයි." හිලරි කීවා.

“රෑ වෙන්න කලින් නවතින්න තැනක් සොයා ගමු.” වයලට් කීවා.

“වයලට් අපි අර ගල් ගුහාවේ නවතිමු ද?” හිලරි ඇසුවා. හිලරිගේ යෝජනාවට එකඟ වූ වයලට් ඒ දෙසට යන්න පටන් ගත්තා.

වයලට් කොළ අත්තකින් ගුහාවේ බිම අතුගාන්න පටන් ගත්තා.

අසල තිබූ පැළෑටියක් ගලවා අල කිහිපයක් ගත් හිලරි ගල් දෙකක් එකට මැද ගිනි ගොඩක් ගැසුවා.
එවිට වයලට් ගිනිගොඩ අසලින් ඉඳගත්තා.

## 4. වනයේ ගත කළ පළමු රාත්‍රිය

වයලට් අලගෙඩි ටික පුච්චලා කමු. හිලරි කීවා.
“මං නම් කන්නෑ. වහද දන්නේ නැනේ” වයලට් කීවා.
“අපේ තාත්තා මේ කැලේට ආවාම ඔය අල ගේනවා. ඒ නිසා කමු”. හිලරි බැගෑපත්ව කීවා.

“ඔයා කියන නිසා කන්නම්” කියූ වයලට් අල පුච්චලා ගත්තා.

පසුව දෙදෙනාම පිළිස්සූ අල කෑවා.

වයලට්ගේ මව බලෙන් ම දැමූ විශාල රෙදි දෙකක් ඇය එලියට ගත්තා. එකක් බිම එළා අනික පොරවාගෙන වයලට් හා හිලරි නිදා ගත්තා.

රෑ අවදි වූ හිලරි වතුර බොන්න බෑගය අසලට ගියා.
“වයලට් මෙතන මොකෙක් හරි ඉන්නවා.”

“මොකෙක් ද?” වයලට් අවදි වී ඇසුවා. මෙතන සර්පයෙක් ඉන්නවා කියා කෑ ගැහු හිලරි නැගිට දුවන්න සැලසුණා.

“ටිකක් ඉන්න” කියා වයලට් සර්පයා අසලට ගියා.
වයලට් මහ හඬින් හිනාවෙන ආකාරය දුටු හිලරි කෝපයෙන් වයලට් දෙස බැලුවා.

හිනාම නවතා ගත නොහැකි වයලට් බැගය අසල තිබූ වැල් පොට ගෙන හිලරිට පෙන්නුවා.

තමා වැල් පොටකට රැවටී ඇති බව දුටු හිලරි බඩ අල්ලාගෙන හිනාවෙන්න ගත්තා. දෙදෙනාම හිනාව අවසන් වූ පසු වයලට් වැල් පොට විසි කළා.

ගුහාවේ කෙළවරක තිබූ මී වදයක වැදුණු වැල් පොට පැත්තකට විසි වුණා. එය දුටු හිලරි වයලට් ද කැටුව විශාල රෙද්දක් අස්සට රිංගා ගත්තා. මී මැස්සන් රෙද්ද වටේ කැරකෙමින් හිඳ යන්නට ගියා.

මඳ වේලාවක් හිඳ එළියට පැමිණි වයලට් හිලරිට මෙසේ කීවා. "හිලරි මී මැස්සෝ නෑ. එළියට එන්න."

හිලරි එළියට පැමිණෙන විට ම බිම වැටී සිටි මී මැස්සෙකු ඇයට පෑගුණා මහත් වේදනාවෙන් බිම ඉඳගත් හිලරි අඬන්න පටන් ගත්තා.

ගුහාවේ කොනක සැදී තිබූ බෙහෙත් පැළෑටියක් දුටු වයලට් එය ගලවා, තලා පොඩිකර හිලරිගේ පාදයේ තැබුවා.

එයින් මඳ සහනයක් ලැබූ හිලරි ඇඬීම නතර කර වයලට්ට ස්තුති කළා.

“මට නම් නිදිමතයි නිදාගමුයි” කියා වයලට් රෙද්ද පොරවා ගත්තා. එයට පිළිතුරක් නොදුන් හිලරි වයලට් අසලට වී නිදාගත්තා.

## 5. අපූරු සිදුවීමක්

පසුදා උදෑසනම අවදි වූ හිලරි තම කකුල පරීක්ෂා කර බැලුවා එවිට මේ මැස්සාගේ තුඩ ඉහළට ඇවිත් තිබුණා. එය නොකැඩෙන ලෙස ඉවත් කළ හිලරි, වයලට්ව කීද්දුවා .

එවිට වයලට් නැගිට විශාල රෙදි දෙක නමා බෑගයට දමා ගත්තා.

"දැන් අපි ගෙදර යන්න පාර හොයමු කියා බෑගය කරට ගනිමින් වයලට් කිව්වා."

"ඉක්මනට යන්න වෙයි. රෑ වුණොත් පාර හොයා ගන්න බැනේ"යි. කියමින් හිලරි වයලට්ගේ අදහසට එකඟ වුණා.

කැලෑවේ මද දුරක් ගිය පසු විශාල අඹ ගසක් දුටු වයලට් සතුටින් ගෑ ගැහුවේ ඇය අධික බඩගින්නකින් සිටි නිසා වයලට් අඹ ගස දෙසට දිව ගියා. අසල තිබූ විශාල නුග මුලක පය වැදුණු වයලට් ගලක් මතට වැටුණා. එවිට ඇය දුටුවා රවුමක් වැනි යමක් ගලේ කොටා තිබෙනවා. එය බොත්තමක් වැනි නිසා වයලට් එයට අත තබා තද කෙරුවා. එවිට, බොත්තමට මඳක් ඈතින් ගලින් සෑදූ සනකයක් වැනි දෙයක් මතු වුණා.

පුදුමයෙන් එදෙසට දිව ගිය හිලරි එය හොඳින් නිරීක්ෂණය කළා. එවිට වයලට් ද එතනට දිව ගියා දෙදෙනාම එකතු වී ගල නිරීක්ෂණය කළා. එවිට එහි සිතියමක් වැනි දෙයක් තිබෙන දුටු හිලරි තම බෑගයේ තිබූ රෙදි කෑල්ලක් ගෙන ගල හොඳින් පිස දැමුවා.

ගල හොඳින් පිස දැමූ පසු ඉතා පැහැදිලි සිතියමක් දක්නට ලැබුණා.

පුදුමයෙන් එලෙස මඳ වේලාවක් බලා සිටි හිලරි පියවි සිහියට ආවිටයි වයලට් ඇය අසල නැති බව දුටුවේ.

තැතිගත් සිතින් යුතුව හිරලි වටපිට බැලුවේ ඉතා කලබලයෙනි එවිට හදිස්සියේ ම වයලට්ගේ සපත්තු දෙක අඹගහ මුල තිබෙනු හිරලි දුටුවා.

නිවුණු සිතින් යුතුව අඹගහ උඩ බැලූ හිලරි මහා හයියෙන් හිනා වුණා. කිසිම ශබ්දයක් නොමැතිව ගස උඩට වී අඹ කන වයලට් දෙස බලා උන් හිලරිව දුටු වයලට් ඉක්මනින් ගසින් බිමට බැස්සා.

"ඉක්මනට එන්න මෙතන සිතියමක් තියෙනවා. හඩ නගා කියමින් හිලරි, සිතියම දෙසට දුවන්නට වුණා.

දිව ගොස් බිම ඉඳගත් හිලරි තම සටහන් පොත ගෙන සිතියම ඇඳ ගත්තා. එවිට තවත් අඹ ගෙඩියක් සපමින් පැමිණි වයලට් විශාල ඇනුමක් ඇරියා.

“අපි දැන්.... මේ සිතියමේ කියන විදිහට යන්න ඕන ද?” කියා වයලට් ඇසුවා.

“ඔව් අපි මේකෙ තියෙන විදියට යමු.” යි හිලරි ගමන ආරම්භ කළා.

## 06. නිධානය සොයා යාම

සිතියමේ කියන විදියට ගමන් කළ ගැහැණු දරුවන් දෙදෙනාට පළමුව හමුවූයේ කුඩා මඩ වගුරක්. වයලට් බිම වැටී තිබුණ කොටයක් ගෙන මඩ වගුර මැදට දැමුවා. තවත් කුඩා කොටයක් තිබෙනු දුටු හිරලි එය ද මඩ වගුරට දැමුවා.

දඟකාර වයලට් ලී කොට දෙකේ දිව ගියා. නොසිතූ ලෙස මඩ වගුරට ඇද වැටුණු වයලට් වාසනාවකට මෙන් මඩේ එරුණේ දණහිස තෙක් පමණි.

පාද දෙකට අපහසුවක් දැනුණු නිසා වයලට් කලිසම දණහිස තෙක් කොට කරගෙන සිටියා. ඒ නිසා කලිසමේ නම් මඩ ගෑවුනේ නැහැ.

තවත් එරෙමින් සිටි වයලට් කෑ ගසන්න පටන් ගත්තා. අසල ගසක එල්ලෙමින් තිබූ වැලක් කලබලයෙන් අතට ගත් හිලරි දුටු වයලට් තවත් හයියෙන් කෑ ගසන්නට පටන් ගත්තේ ඇයගේ අතේ තිබුණේ වැලක් නොව සර්පයෙක් නිසා.

තමාගේ අතේ සිටින්නේ සර්පයෙකු බව දුටු හිලරි නොදැනුවත්ව ම සර්පයාව මඩ වගුරට විසි කළා.

නැවතත් කෑ ගැසූ වයලට් තැතිගත් සිතින් යුතුව අපහසුවෙන් ගොඩට එන්න පටන් ගත් අතර හිලරි,

ඇගේ සහයට විශාල වැල් පොටක් මඩ වගුරට දැමුවා. එහි එල්ලී ආ වයලට් තරහින් හිලරි දෙස බැලුවා.

“හරි හරි අපිට ඊළඟට හම්බවෙන්නේ ඇළක්. එතනින් හෝදගමු.” යි කිවු හිලරි නැවතත් ගමන ආරම්භ කළා.

කැලයේ මඳ දුරක් ගිය විට ඈතින් වතුර ගලන ශබ්දයක් ඇසුණු වයලට් ඒ දෙසට දිව ගියා. විශාල ඇළ දුටු වයලට් සතුටින් කකුල් දෙක හොඳින් සෝදා ගත්තා.

“කලිසම කොට කර ගත්ත” යි කියමින් වයලට් ඇළ දෙසට යන්න ගත්තා. කලිසම කොට කරගත් හිලරි ඇළ තරණය කරන්න පටන් ගත්තා. දෙදෙනාම ඇළෙන් එගොඩට ආවත් හිලරිගේ බෑගය එහා ඉවුරේ තබා ඇති බව දුටු හිලරි නැවත බෑගය ගෙන එගොඩට පැමිණියා. ඊළඟට ඔවුන්ට විශාල ගල් පියගැට පෙළක් දක්නට ලැබුණා. ගලක හිඳගත් වයලට් විඩා නිවා ගත්තා. අසල තිබූ දම් පාට මල් වර්ගයක් කඩමින් සිටි හිලරි, වයලට් අසලට වී ඉඳගත්තා.

“දැන් අපි යමු නේද?”යි පැවසූ හිලරි ඉඳගෙන හිටිය තැනින් නැගිට්ටා.

“ඔව් නැත්නම් වෙලා යයි” යි පැවසූ වයලට් නැගිට පියගැටපෙළ නගින්න පටන් ගත්තා.

## 07. නිධානය ගොඩ ගැනීම

පියගැට පෙළ නගින අතර මග රතු පාට හා කහ පාට මල් පිපී තිබුණා. පියගැටපෙළ අවසන් වූයේ කුඩා තැනිතලාවකිනි.

මද උස් බිමක පිහිටි තැනිතලාවට, ඈත දර්ශනීය ලෙස පෙණුනා.

ඈත හොඳින් නිරීක්ෂණය කළ හිලරි වයලට්ගෙන් වේලාවේ ඇසුවා.

"පහට තව විනාඩි පහක් තියෙනවා."යි කියූ වයලට් බෑගයෙන් අඹ ගෙඩියක් ගෙන කන්න පටන් ගත්තා.

"සිතියමේ තිබුණු විදියට නම් අර කඳු දෙකේ හෙවණැලි දෙක හවස පහට හරියටම එකතු වෙන්න ඕන" යි තනියම සිතුවා.

වයලට්ගේ ඔරලෝසුව ඉල්ලාගත් හිලරි එය සාක්කුවට දමා ගත්තා. හවස පහ වනතුරු මල් කඩමින් වුන් හිලරි හදිස්සියේම වේලාව බැලුවා. හරියටම වේලාව පහ වෙලා තිබුණා.

හදිසියෙන් දිවගිය හිලරි හෙවණැලි එකට වුණ තැන දැක්කා. ශක්තිමත් ලීයක එක් පැත්තක් උල් කරමින් සිටි වයලට් එයද රැගෙන දිව ගියා.

ඉක්මනින් ලීය අතට ගත් හිලරි එතන ලකුණු කර ගත්තා.

ලීය වයලට් අතට දුන් හිලරි වතුර බෝතලය ගෙන ලකුණු කළ ස්ථානයට වතුර දැම්මා. එයින් පස බුරුල් වූ නිසා වයලට්ට පොළොව හැරීමට පහසු වුණා.

පොළොව හැරීමට පටන් ගත් විටම අහස කළුකර මහ හඬින් අකුණු පිපිරුවා. එවිටම වාගේ එතනට ආ නාගයෙක් වයලට් දෙසට ගමන් කරමින් සිටියා. එය දුටු හිලරි දිව ගොස් වයලට්ව එතැනින් ඉවතට තල්ලු කළා. හිලරි, තම මුත්තාගෙන් ඉගෙන ගත් මන්තරයක් මතක් වී බිමට නැමී වැලි අහුරක් ගෙන මන්තරය මතුරා වැලි අහුර නාගයාගේ ඇඟට විසි කළා. එවිට පෙනය පිම්බු නාගයා කැළය දෙසට ගමන් කළා.

නැවතත් පොළොව හැරීමට පටන් ගත් වයලට් වේගයෙන් පොළව හැරුවා. මදක් පොළොව හැරූ වයලට් කෙනෙකු කෑ ගසන ශබ්දයක් ඇසුණා. කලබලෙන් වටපිට බැලූ වයලට් දුටු දෙසින් පුදුමයට පත් වුණා. හිලරි කිසිම ආධාරයක් නොමැති අහසේ පාවෙමින් සිටියා.

නිධානයක් ගැන කියෙවූ කරුණු අනුව මේ නිධානයට අරක් ගත් අදෘශ්‍යමාන බලවේගයක් බව තේරුම් ගත් වයලට් තම සීයාගෙන් උගත් මන්තරයක් මැතිරුවා.

එවිට අහසේ සිටි හිලරි වේගයෙන් බිමට වැටුණු දුටු වයලට් දිව ගොස් හිලරිව අල්ලා ගත්තා.

කරදර සියල්ල අවසන් යැයි සිතූ හිලරි වයලට්ට ස්තූති කර පොළොව හාරන්න පටන් ගත්තා. අඩි තුනක් පමණ හැරූ පසු විශාල පෙට්ටියක් මතු වුණ.

සතුටින් කෑ ගැසූ හිලරි, වයලට් ද කැටුව නිධානය උඩට ගත්තා.

“තවත් ටිකක් යටට හාරන්න ඕන” යි පැවසූ හිලරි නැවත හාරන්න පටන් ගත්තා. මඳක් හැරූ පසු තවත් කුඩා පෙට්ටියක් හමුවුණා. එයත් අගුලු දා තිබුණා. එහි යතුර සොයා ගත නොහැකි නිසා හිලරි පෙට්ටියට ගලකින් ගැසුවා. ඒත් ඒ කැඩුණේ නැහැ.

එය දුටු වයලට බෑගයේ තිබූ ගිනිපෙට්ටි ගෙන හිලරිගේ සටහන් පොතේ කොළයක් ද ගෙන පෙට්ටිය අසලට ගියා. ගිනි පෙට්ටියේ ගිනිකූරු කීපයක් තිබූ නිසා ඒවායේ වෙඩි බෙහෙත් තිබුණේ ඉතා සුළු ප්‍රමාණයක් නිසා ඒ ටික නිදන් පෙට්ටිය විවෘත කිරීමට මදි වුණා.

ඒ නිසා කුඩා පෙට්ටිය විවෘත කිරීමට තීරණය කළ වයලට් එහි ඉබි කටට වෙඩි බෙහෙත් දැමූවා. ඉන්පසු ඉතිරි වූ ගිනිකූරකින් වෙඩි බෙහෙත් වලට ගිනි තිබ්බා. මඳ වේලාවකින් පුංචි ශබ්දයක් සමඟ ඉබ්බා විවෘත වුණා.

සතුටින් පෙට්ටිය විවෘත කර යතුර ගත් හිලරි නිදන් පෙට්ටි විවෘත කළා.

එහි රන් කාසි විශාල ප්‍රමාණයක් සහ මුතු මාල කිහිපයක් හමුවුණා. ඒ අතර රජුගේ සහ රැජිණගේ ඔටුනු දෙක ද තිබුණා.

පුදුමයෙන් එදෙස බලා අන් හිලරිට කෙනෙකුගේ අඩි ශබ්දයක් ඇසුණා. වටපිට බැලූ හිලරි දුටුවේ තම පියාය. දිව ගොස් පියාව වැළඳ ගත් හිලරි තම පියාට නිධානය පෙන්නුවා.

එවිට වයලට් හිලරිගේ පියා අසලට පැමිණියා. ඈතින් තම පියා එනු දුටු වයලට් ඔහු ළඟට දිව ගියා. තම දියණියන්ගේ වීර ක්‍රියාව දුටු හිලරිගේ පියා සහ වයලට්ගේ පියා ආඩම්බරෙන් නිධානය අසලට ගියා. එය වසා ඔසවාගත් පියවරුන් දෙදෙන දියණියන් දෙදෙනාද කැටුව නිවෙස් වලට ගියා.

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)